# 10 ශ්‍රේණිය සිංහල සාහිත්‍ය රසාස්වාදය

# යුතුකම

## 07 ඒකකය



සැකසුම - හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)

{ආදර්ශ ප්‍රශ්න, පසුගිය විභාග ප්‍රශ්න, පළාත් ප්‍රශ්න විචාර සහ පිළිතුරු අන්තර්ගත කර ඒකකය සම්පූර්ණයෙන් ම ආවරණය කර ඇත.}

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

# 07. යුතුකම

- **විචාර ලිවීමේදී හැඳින්වීම**

✓ ටිබෙට් දේශයේ සිට ලංකාවට පැමිණ බුදු දහමත් ලාංකික පරිසරයත් පිළිබඳව ඇල්මෙන් ජීවිතාන්තය දක්වාම ලංකාවේ විසූ ජාතික වීර වීරවරයෙක් ලෙස එස් මහින්ද හිමියන් හඳුන්වා දිය හැකිය. විදේශිකයකු වුවද උන්වහන්සේ ශ්‍රී ලාංකිකයන් උදෙසා තම ජීවිත කාලයම කැප කළ උතුම් පඬිරුවනකි. කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙසද ද දිගු කාලයක් සේවය කළ උන්වහන්සේ මුල් කාලයේ දී ළමයින් උදෙසා විවිධ කවි රචනා කළ සේක. එකල ඉංග්‍රීසීන්ගේ ආධිපත්‍ය පැතිර තිබූ අතර ඔවුන්ගේ අඩත්තේට්ටම් දුටු උන්වහන්සේ අලස ව සිටි ලාංකිකයා වෙනුවෙන් ජාතියේ නිදහස පතා පොළඹවා ලන පද්‍ය පන්ති රැසක්ම රචනා කරන ලදී. කවිමිණි, කවි මුතු, ළමා කවි කළඹ වැනි ළමා පොත් මෙන්ම නිදහස් මන්ත්‍රය, නිදහසේ දැහැන ආදී පද්‍ය කෘති ඒ අතර වේ. උන්වහන්සේ රචනා කළ **"යුතුකම"** පද්‍ය පන්තියේ ප්‍රධාන තේමාව වී ඇත්තේ රට ජාතිය වෙනුවෙන් අප සතු යුතුකම පහදා දීමයි.

- **ආදර්ශ විචාර ප්‍රශ්න**

1. යුතුකම පද්‍ය පන්තියේ භාෂා භාවිතය පිළිබඳ ඇගයීමක් කරන්න. (ලකුණු 10)
2. යුතුකම් පැදිපෙළ ඇස්. මහින්ද හිමි විසූ යුගයේ සමාජ අවශ්‍යතාවක් කුළු ගැන්වෙන පරිදි ලියැවී ඇත. විමසන්න. (ලකුණු 10)
3. අදීන මිනිසකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු විසින් සිය සිතුම් පැතුම් හැඩගසා ගත යුතු ආකාරය යුතුකම පද්‍ය පංතියෙන් ඉදිරිපත් කෙරේ. පැහැදිලි කරන්න. (ලකුණු 10)
4. සිවුපද ආකෘතිය සාර්ථකව යොදාගත් නිර්මාණයක් ලෙස යුතුකම පැදි පෙළ සැලකිය හැකිය. මේ ප්‍රකාශය නිදසුන් ඇසුරෙන් විමසන්න. (ලකුණු 10)

- **ආදර්ශ කවි**

✓ උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ

✓ ව ඳි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඩ ගසව් තම හිත මිතුරන් ට

✓ අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ළම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම නුඹට

✓ උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

✓ මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

- **<u>පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - ව්‍යුහගත හා කෙටි ප්‍රශ්න</u>**

1.

උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග මි මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො මි සිදුරක තරම් වත් අඩ දබර නොලා
පි මි මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

ව ඳි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඩ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම නුඹට

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

i. මෙම පද්‍ය පන්තියේ තේමාව කුමක් ද? (ලකුණු 05 යි)

ii. කවියා යොදාගෙන ඇති ආකෘතිය එම අත්දැකීම රසවත්ව ඉදිරිපත් කිරීම සඳහා උචිත වන්නේ කෙසේ ද? (ලකුණු 05 යි)

iii. කවියා තම අත්දැකීම ප්‍රබලව ඉදිරිපත් කිරීමට යොදාගත් යෙදුම් **දෙකක්** නම් කරන්න. (ලකුණු 05 යි)

iv. කවියා පාඨකයන්ට ලබා දෙන උපදේශ **දෙකක්** මේ පද්‍ය පංතියෙන් උපුටා දක්වන්න.

v. කවියා යොදාගත් භාෂාව රස නිෂ්පත්තිය උදෙසා කෙතෙක් දුරට ගැළපේ ද? (ලකුණු 10 යි)

(ලකුණු 25 යි)

(2017 o/L)

2.

උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ

i. 'බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ' යන්නෙන් මතු කෙරෙන අර්ථය කුමක් ද?
(ලකුණු 02 යි)

ii. මෙම කවිය ඇතුලත් පැදි පෙළේ රචකයා කවරෙක් ද? (ලකුණු 02 යි)

(2016 o/L)

3.

උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග මි මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො මි සිදුරක තරම් වත් අඬ දබර නොලා
පි මි මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමවි ගම්මුන්ටම එක් වෙන්ට

ව දි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම නුඹට

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමගි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

i. මෙහි සඳහන්කර ඇති යුතුකම් දෙකක් දක්වන්න. (ලකුණු 05 යි)

ii. විස්වාසයක් තබන්නට එපායයි මෙහි සඳහන් කර ඇත්තේ කවුරුන් පිළිබඳව ද?. (ලකුණු 05 යි)

iii. මෙම පද්‍ය පන්තිය තුළින් කවියා සමාජයට ලබාදෙන පණිවුඩය කුමක් ද? (ලකුණු 05 යි)

iv. මෙම පද්‍ය පන්තියේ භාෂාව එහි සාර්ථකත්වය සඳහා බලපා ඇති ආකාරය පිළිබඳ විමසීමක් කරන්න. (ලකුණු 10 යි)

(ලකුණු 25 යි)

(2018 NW 2nd Term )

4. උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ
එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ
එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ
බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ

නම් බුව කැමති අය ඇති නම් නො වී මුළා
ග මි මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා
ලො මි සිදුරක තරම් වත් අඬ දබර නොලා
පි මි මක් පනිමු ගම්මුන්ගේ ජය ම බලා

උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට
ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට
බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට
ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට

ව ඳි න් නේ නැතිව ලොකු නිලධාරින් ට
ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට
හි ති න් වත් කැමති නම් එය කර ගන් ට
ඉ ති න් අඬ ගසව් තම හිත මිතුරන් ට

ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා
අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා
ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා
අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා

අ පේ රට අපේ ජාතිය අපේ ගම
අ පේ අසල්වැසියා යන සියල් ලම
අ පේ අතට අවනත කර ගෙන වහම
අ පේ නමට සලකත දිවි දෙමු මෙහෙම නුඹට

මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා
සොලොවා මරා වළලන්නට යොදා උපා
කුල මල උගුල් අටවන බොරු බණක් පපා
නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා

i. අඬ දබර නොවී සිටින්නට යැයි කවියා පවසන්නේ කුමන අයුරින් ද? (ලකුණු 05 යි)
ii. ගමට ආදරයක් ඇත්නම් කෙසේ සිටිය යුතුදැයි කවියා ප්‍රකාශකර ඇත් ද? (ලකුණු 05 යි)
iii. නිලධාරීන් පිළිබඳ කවියාගේ ආකල්පය පැහැදිලි කරන්න (ලකුණු 05 යි)
iv. මෙම පද්‍ය පන්තියේ ඇතුළත් කාව්‍යාලංකාර 3ක් උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 10 යි)

(ලකුණු 25 යි)
(2020 NW 2nd Term )

හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

- <u>**පසුගිය විභාග ප්‍රශ්න සහ ආදර්ශ ප්‍රශ්න - ව්‍යුහගත හා කෙටි ප්‍රශ්න පිළිතුරු**</u>

1. (2018 NW 2nd Term)

I. බියෙන් තැති නොගැනීම.
අඩ දබර නොවී සිටීම.
මුලා නොවී සිටීම.
ලොකු නිලධාරීන්ට බිය නොවී සිටීම.

II. කුල මල උගුල් අටවන නිලධාරීන් ට.

III. නිදහස් නිවහල් මිනිසෙකු ලෙස තම යුතුකම් ඉටුකරමින් ජීවත්විය යුතු ආකාරය පිලිබඳ ප්‍රකාශවන පිලිතුරක් අපේක්ෂා කෙරේ.

යුතුකම් පද්‍ය පන්තිය සමාජ අවශ්‍යතාවයන් තුළු ගැන්වෙන පරිදි ලියැවී ඇත. විදේශිකයන්ට යටත්ව නිදා සිටි සිංහලයන්ට තම යුතුකම් සිහිගැන්වීම මෙහි අරමුණ වී ඇත. රට නිදහස් කර ගැනීමේට නම් ජනතාව එකමුතු විය යුතු ය.

**“ග මි මුන් සැවොම ගම්මුන්ට ම එකතු වෙලා”**

ජනතාව එකට එකතු වී කටයුතු කළ හොත් රට නිදහස් කර ගැනීමට හැකිවනු ඇත. හිතමිතුරු සියලු දෙනා කැඳවා ගෙන තමන්ගේ උරුමය, අයිතිය රැක ගැනීමට කටයුතු කිරීම යුගයේ අවශ්‍යතාවක් බව කවියා දක්වයි.

**“ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට**
**ඉ ති න් අඩ ගසව් තම හිත මිතුරන් ට””**

**“කුල මල උගුල් අටවන බොරු බණක් පපා**
**නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා””**

මෙලෙස නිදහස් නිවහල් මිනිසෙකු ලෙස තම යුතුකම් ඉටුකරමින් ජිවත්විය යුතු ආකාරය පැහැදිලි කරමින් සමාජ අවශ්‍යතාව කුළු ගැන්වීම් සඳහා කවියා උත්සාහ දැරූ ආකාරය ඉහත නිදසුන් තුලින් පැහැදිලි වේ.

IV. කවියා මෙම පද්‍ය පන්තිය රචනා කිරීමේදී සරල බස් වහරක් යොදා ගෙන ඇත එමෙන්ම කථන බස ද යොදාගෙන ඇත.

**බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට**
**අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා**
**අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා**

මෙහි ඇතුළත් **අහු මුළු වල රිංගන්ට, ඔලුවත් කපා, අයුත්තකට** වැනි යෙදුම් කටවහර යොදා ගත් අවස්ථා ය. අනුප්‍රාසාත්මක වදන් යොදා ගැනීම ද මෙහි බස්වහරේ දැකිය හැකි ලක්ෂණයකි.

**අ පේ රට අපේ ජාතිය අපේ ගම**

එලෙසම විරිත හා රිද්මය තුළින් කවි ගායනා කිරීමේ දී හැඟීම් දනවන සුලු වීම එහි සාර්ථකත්වයට මනා ලෙස ඉවහල් වී ඇත. කවියේ මුල, අග එළිසමය ගනිමින් පද්‍ය රචනා කිරීමට ද කවියා සමත් වී ඇති බව පැහැදිලි වේ.

**උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට**
**ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට**

**බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට**
**ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට**

මෙලෙස සරල බස, ව්‍යවහාර බස, අනුප්‍රාසය, එළි සමය වැනි කරුණු මෙහි බස් වහරේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයන් ය.

2. (2020 NW 2nd Term)

I. ලො මි සිදුරක තරම් වත් අඬ දබර නොලා

II. බියසුලු ගති නොපෙන්වා අතත් පයත් ඔලුවත් වෙනම කපා කෑවත් අයුක්තියට අත් දෙක නො ඔසවා සිටීම.

III. නිලධාරීන්ට නොවැදිය යුතු බව
ගම්මුන්ගේ සමගිය නැතිකරන පිරිසක් බව
බොරු දේ ප්‍රකාශ කරමින් උගුල් අටවන බව
කුලමල භේද සලකන බව
විශ්වාස කළ නොහැකි පිරිසක් බව
.

IV. සිව්පද ආකෘතිය
සරල බව
අනුප්‍රාස භාවිතය
විධානාත්මක යෙදුම්
ව්‍යංගාර්ථ භාවිතය

කවියා මෙම පද්‍ය පන්තිය රචනා කිරීමේදී සරල බස් වහරක් යොදා ගෙන ඇත එමෙන්ම කථන බස ද යොදාගෙන ඇත.

**බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට**
**අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා**
**අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා**

මෙහි ඇතුළත් **අහු මුළු වල රිංගන්ට, ඔලුවත් කපා, අයුත්තකට** වැනි යෙදුම් කටවහර යොදා ගත් අවස්ථා ය. අනුප්‍රාසාත්මක වදන් යොදා ගැනීම ද මෙහි බස්වහරේ දැකිය හැකි ලක්ෂණයකි.

**අ පේ රට අපේ ජාතිය අපේ ගම**

එලෙසම විරිත හා රිද්මය තුළින් කවි ගායනා කිරීමේ දී හැඟීම් දනවන සුලු වීම එහි සාර්ථකත්වයට මනා ලෙස ඉවහල් වී ඇත. කවියේ මුල, අග එළිසමය ගනිමින් පද්‍ය රචනා කිරීමට ද කවියා සමත් වී ඇති බව පැහැදිලි වේ.

**උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට**
**ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට**
**බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට**
**ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට**

පද්‍ය පන්තිය රචනා කිරීමේදී කවි හිමියන් සිවුපද ආකෘතිය යොදා ගෙන ඇත. එය පද්‍ය පන්තියේ සාර්ථකත්වය සඳහා හේතු වී ඇත. පද හතරකින් සහ එළිවැට රැකීමෙන් ද පද්‍ය පන්තිය සාර්ථක කරගගෙන ඇති අයුරු දැකිය හැකි ය. තම අත්දැකීම් ප්‍රකාශ කිරීමේදී මෙම කාව්‍ය ආකෘතිය සාර්ථකව යොදා ගෙන ඇත.

**උ ප න් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ**
**එ යි න් පිටත්තර වෙන විදියකින් නොවේ**
**එ යි න් එහෙම නම් තම යුතුකම හමුවේ**
**බි යෙ න් තැති ගැනුම අපහට තරම් නොවේ**

මෙලෙස සරල බස, ව්‍යවහාර බස, අනුප්‍රාසය, එළි සමය වැනි කරුණු මෙහි බස් වහරේ දැකිය හැකි සුවිශේෂී ලක්ෂණයන් ය.



හසිත හෙට්ටිආරච්චි
(Dip. In Sci. N.I.E./O.U.S.L.)

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

**03. 'යුතුකම' පැදිපෙළ ඇස්.මහින්ද හිමි විසූ යුගයේ සමාජ අවශ්‍යතාවක් කුළු ගැන්වෙන පරිදි ලියැවී ඇත. විමසන්න. (ලකුණු 15)**

ටිබෙට් දේශයේ සිට ලංකාවට පැමිණ බුදු දහමත් ලාංකික පරිසරයත් පිළිබඳව ඇල්මෙන් ජීවිතාන්තය දක්වාම ලංකාවේ විසූ ජාතික වීර වීරවරයෙක් ලෙස එස් මහින්ද හිමියන් හඳුන්වා දිය හැකිය. විදේශිකයකු වුවද උන්වහන්සේ ශ්‍රී ලාංකිකයන් උදෙසා තම ජීවිත කාලයම කැප කළ උතුම් පඬිරුවනකි. කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙසද ද දිගු කාලයක් සේවය කළ උන්වහන්සේ මුල් කාලයේ දී ළමයින් උදෙසා විවිධ කවි රචනා කළ සේක. එකල ඉංග්‍රීසීන්ගේ ආධිපත්‍ය පැතිර තිබූ අතර ඔවුන්ගේ අඩත්තේට්ටම් දුටු උන්වහන්සේ අලස ව සිටි ලාංකිකයා වෙනුවෙන් ජාතියේ නිදහස පතා පොළඹවා ලන පද්‍ය පන්ති රුසක්ම රචනා කරන ලදි. කව්මිණි, කවි මුතු, ළමා කවි කළඹ වැනි ළමා පොත් මෙන්ම නිදහස් මන්ත්‍රය, නිදහසේ දැහැන ආදී පද්‍ය කෘති ඒ අතර වේ. උන්වහන්සේ රචනා කළ **'යුතුකම'** පද්‍ය පන්තියේ ප්‍රධාන තේමාව වී ඇත්තේ රට ජාතිය වෙනුවෙන් අප සතු යුතුකම පහදා දීමයි.

**උ ප ත් නෙත් මැරෙන්නෙත් තනියම යි ලොවේ**
**එ යි ත් පිටත්තර වෙන විදියකින් නොවේ**
**එ යි ත් එහෙම නම් තම යුතුකම හමුවේ**
**බි යෙ ත් නැති ගැනුම අපහට තරම් නොවේ**

මහින්ද හිමියන් වැඩ විසූ යුගය ඉංග්‍රීසීන්ගේ ආධිපත්‍ය රට පුරා විසිර තිබූ අවධියකි. එදවස ජනතාව නිදහස් මාවතට උසිගැන්වීමට කවින් යොදාගත් කාව්‍යෝපක්‍රමයක් වන ඍජු, උද්වේගකර, ආවේගශීලීත්වය මෙම කවිපෙළ පුරා දක්නට ලැබේ. අවවාදාත්මක ස්වරූපයෙන් උපදේශාත්මක කාව්‍ය ලක්ෂණ යොදා ගනිමින් රචිත උක්ත සමාරම්භක කවිය ම ඊට කදිම නිදසුනකි. එම යුගයේ කාලීන අවශ්‍යතාවක් වූ නොබියව නැගීසිටීමේ අවශ්‍යතාව මින් පැහැදිලි කරයි. කවියාගේ සංකල්පය වන්නේ අප ඉපදෙන්නේත් මිය යන්නේත් තනිවම බවයි. එය ලෝ දහමයි. එසේ නම් අප යුතුකම් ඉටු ඉටු කිරීමට බිය විය යුතු නැති බව කවියා අවධාරණය කරයි. මෙය මහින්ද හිමියන් තුළ වූ ජීවන දෘෂ්ටියයි.

**ව දි න් නේ නැතිව ලොකු නිලධාරින් ට**
**ත ම න් ගේ බලය උරුමය රැක ගන් ට**
**හි ති න් වන් කැමති නම් එය කර ගන් ට**
**ඉ ති න් අඩ ගසව් තම හිත මිතුරන් ට**

මෙම පද්‍ය පන්තිය මගින් වර්තමානයේ ජීවත්වන අපට අතීත ලාංකිකයා පීඩාවට හා අසාධාරණයට ගොදුරු වූ ආකාරය ධ්වනිත කරයි. උන්වහන්සේ විසූ යුගයේ පැවති එකී අසාධාරණය කිසි ලෙසකින් ඉවසිය නො හැක්කකි. නිලධාරිවාදය ඉතා ප්‍රබල ව පැවැති කාලයක් වූ එකල ජනයාට සිදු වූයේ නිලධාරීන්ට වැඳ වැටෙමින් ජීවත් වීමටයි. ඒවාට එරෙහි වීමට සාමාන්‍ය ජනයාට නොහැකි වූ අතර එලෙස එරෙහි වීම විනාශයට හේතුවේ. මෙය පිටු දැකීමට නම් සියලූ දෙනා එකතු වී කටයුතු කළ යුතුය. එසේ නොවන්නේ නම් ශ්‍රී ලාංකිකයාගේ උරුමය රැක ගැනීමට නොහැකි වී යයි. මහින්ද හිමියන් තම පද්‍ය නිර්මාණය හරහා මේ බව පැහැදිලි කරයි. අයිතීන් රැක ගැනීමට ගම්මුන්ට ආරාධනා කරනවා වෙනුවට ලබා දෙන විධානයක් උක්ත පද්‍ය පන්තියෙන් කවියා සිදුකරයි.

**අ පේ රට අපේ ජාතිය අපේ ගම**
**අ පේ අසල්වැසියා යන සියල් ලම**
**අ පේ අතට අවනත කර ගෙන වහම**
**අ පේ නමට සලකන දිවි දෙමු මෙහෙම**

පාඨකයා තුළ අභිමානයක් ජනිත කිරීමට සමත් වී ඇති අයුරු මෙම කවි පෙළෙන් දැකිය හැකිය. 'මම' ය 'මගේ' ය යන සංකල්පයට වඩා 'අපේ' යන සංකල්පය ගැමි ජනයා තුළ රෝපණය කිරීමට කවියා උත්සාහ දරා ඇත. මෙය එකල කාලීන අවශ්‍යතාවයකි. 'අපේ රට' 'අපේ ජාතිය' ආදී ලෙස ශ්‍රී ලාංකික යන ජාතිය මතු කර දක්වන කවියා අපේ කම වෙනුවෙන් ජීවිතය වුව ද පිදිය යුතු බව ප්‍රකාශ කරයි. සමාජ අසාධාරණයට එරෙහි වනවා මෙන්ම අපේකම ඇගයීම ද අගනා පණිවිඩයකි. මෙලෙස බ්‍රිතාන්‍යයන්ට අප රට යටත් ව තිබූ යුගයක සමාජ අවශ්‍යතාවයන් කුළු ගැන්වෙන ආකාරයට කාලීන අවශ්‍යතාව උදෙසා කවිය අවියක් කොට ගත් මහින්ද හිමියන්ගේ අතිශය සාර්ථක පද්‍ය පන්තියක් ලෙස 'යුතුකම' පැදි පෙළ අගයකළ හැකිය.

Hasitha hettiarachchi
071-9020298

**2. අදීන මිනිසකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු විසින් සිය සිතුම් පැතුම් හැඩගසා ගත යුතු ආකාරය යුතුකම පද්‍ය පංතියෙන් ඉදිරිපත් කෙරේ. පැහැදිලි කරන්න. (ලකුණු 10)**

ටිබෙට් දේශයේ සිට ලංකාවට පැමිණි බුදු දහමත් ලාංකික පරිසරයත් පිළිබඳව ඇල්මෙන් ජීවිතාන්තය දක්වාම ලංකාවේ විසූ ජාතික වීර වීරවරයෙක් ලෙස එස් මහින්ද හිමියන් හඳුන්වා දිය හැකිය. විදේශිකයකු වුවද උන්වහන්සේ ශ්‍රී ලාංකිකයන් උදෙසා තම ජීවිත කාලයම කැප කළ උතුම් පඬිරුවනකි. කොළඹ ආනන්ද විද්‍යාලයේ ගුරුවරයෙකු ලෙසද ද දිගු කාලයක් සේවය කළ උන්වහන්සේ මුල් කාලයේ දී ළමයින් උදෙසා විවිධ කවි රචනා කළ සේක. එකල ඉංග්‍රීසීන්ගේ ආධිපත්‍ය පැතිර තිබූ අතර ඔවුන්ගේ අඩත්තේට්ටම් දුටු උන්වහන්සේ අලස ව සිටි ලාංකිකයා වෙනුවෙන් ජාතියේ නිදහස පතා පොළඹවා ලන පද්‍ය පන්ති රැසක්ම රචනා කරන ලදී. කව්මිණි, කවි මුතු, ළමා කවි කළඹ වැනි ළමා පොත් මෙන්ම නිදහස් මන්ත්‍රය, නිදහසේ දැහැන ආදී පද්‍ය කෘති ඒ අතර වේ. උන්වහන්සේ රචනා කළ **"යුතුකම"** පද්‍ය පන්තියේ ප්‍රධාන තේමාව වී ඇත්තේ රට ජාතිය වෙනුවෙන් අප සතු යුතුකම පහදා දීමයි. එලෙසම අදීන මිනිසකු ලෙස සමාජයේ ජීවත් වීමේ දී කෙනෙකු විසින් සිය සිතුම් පැතුම් හැඩගසා ගත යුතු ආකාරය ද ඉන් අවධාරණය කරයි.

**මුල බැස තිබෙන ගම්මුන්ගේ සමඟි සැපා**
**සොලොවා මරා වළලන්නට යොදා උපා**
**කුල මල උගුල් අටවන බොරු බණක් පපා**
**නිලධාරින්ට විස්වාසය දෙන්ට එපා**

අතීත සමාජය කුලමල බේද නිසා බෙදී වෙන්ව තිබූ බව පැහැදිලිය. පාලකයන් එම භේද බින්නතා තව තවත් වර්ධනය කර ඇත. නිලධාරීන්ට සහ ඉංග්‍රීසි පාලකයන්ට අවශ්‍ය වූයේ සම්මුති වශයෙන් මිනිසුන් එකට එක්වී තම අරමුණ වෙත ක්‍රියාකිරීම වැළැක්වීම ය. ඒ නිසා කවර හෝ ආකාර උපාය යොදා බෙදා වෙන් කොට පාලනය කිරීමට ඉංග්‍රීසීන් ට අවශ්‍ය විය. ඒ සඳහා යෙදූ උපාය කුල භේද මතු කොට බෙදා වෙන් කිරීමයි. එහෙත් මහින්ද හිමි අවධාරණය කළේ එම කුලමල ජාති ආගම් භේද බැහැර කොට එක්සිත්ව එක් අරමුණක් ක්‍රියා කළ යුතු බව ය. කවියා එය අපට අවධාරණය කළේ මෙසේ අවවාදාත්මක උපදෙස් සපයමින් බව පැහැදිලි වේ අදින මිනිසකු ලෙස ජීවත් සමාජය තුළ ජීවත් වීමේදී කුල මල බේද නොසලකා ජීවත්වීමේ උතුම් ගුණාංගය ඉන් අවධාරණය කරයි.

**ඇතොත් ගමට ආදරයක් සිතින් සිපා**
**අ ත ත් පයත් ඔලුවත් වෙන වෙන ම කපා**
**ක ත ත් කමක් නැහැ බියසුලු ගතිය පපා**
**අ යු ත් තකට අත් දෙක ඔසවන්ට එපා**

සිංහල ජාතිය අදීන ජාතියකි. වසර දෙදහස් පන්සියයකට වැඩි ඉතිහාසයක් ඇති ථේරවාදී බෞද්ධ රටකි. ඒ තුළ අතීත රජවරු පවා යුක්තියට සාධාරණයට දිවි දුන් අවස්ථා එමට ය. ඒ අතීත විභූතිය ද පාඨකයාට සිහිපත් කරමින් ගම් දනව්වල වෙසෙන ජනයා එකිනෙකා අතර පවතින අඩදබර අමතක කොට අත්වැල් බැඳගත යුතු බව කවියා පවසයි. එසේ දෑත් බැඳ දියුණුවේ මාවත වෙත යහපත් අරමුණින් පෙළගැසිය යුතු ය. අතීතයටත් වර්තමානයටත් අනාගතයටත් යන තුන් කාලයටම උචිත වන අවවාදයක් ඒ තුළ අන්තර්ගත ය.

**උ ප න් ගමේ බල උරුමය රැක ගන්ට**
**ස ට න් කෙරුම සතුටක් නම් වැසි යන්ට**
**බියෙ න් නොගොස් අහු මුළුවල රිං ගන්ට**
**ඉ ති න් යමව් ගම්මුන්ටම එක් වෙන්ට**

වර්තමානයේ ජීවත්වන අපට අතීත ලාංකිකයෝ පීඩාවට අසාධාරණයට ගොදුරු වූ ආකාරය උක්ත පද්‍යයෙන් ධ්වනිත කරයි. ඉංග්‍රීසීන්ට නතු වූ ලාංකික නිලධාරින්ගේ පීඩනයත් එකල දුප්පත් අසරණ මිනිසුන්ට කොතරම් හිංසනයක් වීද යන්නත් මහින්ද හිමියන් අවධාරණය කර තිබේ. ඒවාට එරෙහි වීමට තරම් අයෙකු නොවී ය. එරෙහිවීම විනාශයට හේතු වේ. එනිසාම කවියා සෙසු ජනයාට ඇරයුම් කරන්නේ වහ වහා මේ ව්‍යසනය පිටුදැකීමට පෙළගැසිය යුතු බව ය. එසේ නොවන්නේ නම් ලාංකිකයාගේ උරුමය රැක ගත නොහැකි ය.

මෙලෙස වර්තමානයේ ජීවත්වන ඕනෑම අයෙකුට අදීන මිනිසකු ලෙස සමාජයේ ජීවත්වීමට සිතුම් පැතුම් හැඩගස්වා ගැනීමට කදිම උපදේශ රැසක් යුතුකම පද්‍ය පංතියෙන් ඉදිරිපත් කෙරේ.

Hasitha hettiarachchi
071-9020298